# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,498 - 2026 ජූලි මස 17 සිකුරාදා - 2026.07.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |


*සැ.යු.*: සත්ත්ව සුභසාධන පනත් කෙටුම්පත 2026.07.17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අගෝස්තු මස 07 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 24 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


0000 - B 82810 - (2026/07)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙළින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. :

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකුලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## විගණන සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ශ්‍රේණියේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති තනතුර සඳහා ඍජු ධාරාව මත බඳවා ගැනීම - 2026

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ශ්‍රේණියේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති තනතුරට ඍජු ධාරාව මත බඳවා ගැනීම සඳහා (පුරප්පාඩු සංඛ්‍යාව 02 කි) අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **බඳවා ගැනීමේ ක්‍රමය:-**
මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ලබා ගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පරිශිෂ්ටය 03 හි සඳහන් පරිදි පහත නිර්ණායකයන්ට යටත්ව (අංක 5 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ :

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද | 40 |
| තොරතුරු තාක්ෂණය/පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් | 05 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 10 |
| **එකතුව** | **100** |

*සටහන :-* බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.
පත්වීම ක්‍රියාත්මක වන දිනය විගණන සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අයදුම්කරුවකුම අයදුම්පත් කැඳවන අවසාන දිනට පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

**I.** **අධ්‍යාපන සුදුසුකම් :** අදාළ නොවේ;

**II.** **වෘත්තීය සුදුසුකම් :**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය;

**III.** **පළපුරුද්ද:**

බාහිර අයදුම්කරුවෙක් නම් - අදාළ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර දොළහක (12) ක සේවා පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ නියුතු අයදුම්කරුවෙක් නම් - විධායක මට්ටමේ තනතුරක වසර දොළහක (12) ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.
(මේ සම්බන්ධයෙන් සේවා කාලය ගණන් ගැනීමේදී පූර්ණ වැටුප් සහිත, අඩ වැටුප් සහිත සහ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු සැලකිල්ලට ගනු නොලැබේ.);

**IV.** **ශාරීරික යෝග්‍යතාව:**

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම;

**V.** **වෙනත් සුදුසුකම්:**

(i). ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;
(ii). විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;
(iii). යම් ආගමික පැවිදිවරයක් දරන තැනැත්තකු නොවීම;
(iv). අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**VI.** **වයස:**

**2026 අගෝස්තු 10** දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, එදිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1981.08.10 දින සිට 1991.08.10 දින දක්වා එම දින ද ඇතුළත්ව උපන් දිනය යෙදෙන අයට අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.
(රාජ්‍ය සේවයේ නියුක්ත නිලධරයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි :-**

(i). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii). මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධරයකු මෙම තනතුරට පත් කරනු ලැබුවහොත් වසරක පරිවාස කාලයකට යටත් වේ. එසේ වුවද එම නිලධරයාගේ පූර්ව සේවා කාලය හා පළපුරුද්ද නව තනතුරට අයත් සුදුසුකමක් නොවන කල්හි අවුරුදු තුනක පරිවාස කාලයට යටත්වේ. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii). 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේක ව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v). ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4. **වැටුප් පරිමාණය** :- 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 86,950- 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 - රු.200,770/- (පියවර 20) වේ. ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් කේතය AS 03 - 2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.138,370/- වේ. (2027.01.01 දින තෙක් ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ උපලේඛන III අනුවය.) මෙයට අමතරව තනතුරට අදාළ වන පරිදි රජය විසින් අනුමතකර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| *අනු අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| I | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | 25 |
| | (අ) **සාමාන්‍ය උපාධිය** | 10 | |
| | (ආ) **විශේෂ උපාධිය** | 11 | |
| | (ඇ) **2 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය** | 11 | |
| | (ඈ) **2 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය** | 13 | |
| | (ඉ) **1 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය** | 13 | |
| | (ඊ) **1 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය** | 15 | |
| | (උ) **පශ්චාත් උපාධි ඩිප්ලෝමාව** | 18 | |
| | (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | | |

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | (ඌ) **MA/MSC හෝ ඒ හා සමාන වෙනත් උපාධියක්**<br>(රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 20 | |
| | (එ) **ඉහත (ඌ) හි සඳහන් උපාධියකට වඩා ඉහළ උපාධිය**<br>(රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 25 | |
| II | **අතිරේක වෘත්තිය සුදුසුකම්**<br>**(මූලික වෘත්තීය සුදුසුකමට අමතරව ලබා ඇති ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)** | | 20 |
| | (අ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 07 | |
| | (ආ)වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික II /අන්තර්මාධ්‍ය පරීක්ෂණය /ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික පත්‍රය II / ව්‍යාපාර අදියර/ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ II අදියර පරීක්ෂණය සමත් වීම | 09 | |
| | (ඇ)වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය / වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ III අදියර පරීක්ෂණය සමත් වීම | 12 | |
| | (ඇ)වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්ව | 15 | |
| | (ඉ)වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය | 20 | |
| III | **තොරතුරු තාක්ෂණය / පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් :**<br>විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන මාස 6ක හෝ ඊට වැඩි කාලයක පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම හා සහතිකයක් ලබා තිබීම. | 05 | 05 |

ඉහත සටහනට අමතරව තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 05 බැගින් **උපරිම ලකුණු 40 ක් ද,** සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා **උපරිම ලකුණු 10 ක් ද** වෙන් කර ඇත. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

6. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-**

(i). අයදුම්පත් **"ලේකම්, විගණන සේවා කොමිෂන් සභාව, අංක 415, කොටා පාර, රාජගිරිය"** යන ලිපිනය සඳහන් කර **2026 අගෝස්තු 17** දින හෝ එදිනට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii). ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට අංක 08 දක්වාත් තෙවැනි පිටුව අංක 09 සිට අංක 10 දක්වාත් වන ආකාරයට පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii). අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"ඍජු ධාරාව මත ජ්‍යොෂ්ඨ සහකාර විගණකාධිපති තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iv). අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන විධායක ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v). අයදුම්පතක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදුවිය හැකි ප්‍රතිවිපාක තමන් විසින් ම විඳ දරා ගත යුතු ය.

(vi). විදේශගත ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට තම අයදුම්පත් විගණන සේවා කොමිෂන් සභා ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි රටට *නැතහොත්* ආසන්නම රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(vii). වෛද්‍ය පරීක්ෂණ සඳහා යානාපත්‍ර - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ශ්‍රී ලාංකික අයදුම්කරුවෙක් වේ නම්, ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු ය. එම පරීක්ෂණය සඳහා වන ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ යානාපත්‍ර වියදමත් එම අයදුම්කරු විසින් ම දැරිය යුතු ය.

(viii). රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් නියමිත දින හෝ එදිනට පෙර ලැබෙන සේ මා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෙම කාර්යාලයේ කිසිදු නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතු ය.

(ix). මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(x). අයදුම්පත්‍රය සමඟ පහත ලේඛනවල ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය.

(a) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත
(b) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත
(*සැ.යු :-* බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.)
(c) සාමාන්‍ය උපාධිය සහ එයට ඉහළ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්)
(d) ප්‍රධාන වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ 2. II පරිදි) සහ අතිරේක වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්) සනාථ කෙරෙන සහතිකවල පිටපත්
(e) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්
(f) තොරතුරු තාක්ෂණය හා පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්)
(g) චරිතය පිළිබඳව සඳහන් වන මෑතකදී ලබාගත් සහතික දෙකක්
(දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

*සටහන* - සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථ කර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

8. **සාවද්‍ය තොරතුරු සැපයීම:-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු

කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හා නොපිරවීමේ අයිතිය විගණන සේවා කොමිෂන් සභාව සතු වේ.

10. මෙම *ගැසට්* පත්‍රයේ I කොටසේ II (අ) වැනි ඡේදයේ ආරම්භය සඳහන් කර ඇති පරිදි රාජ්‍ය සේවා පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි මෙම තනතුරට බඳවාගැනීම සඳහා ද අදාළ වේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විගණන සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එච්. එම්. නන්දසේන,**
අතිරේක ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම් *වෙනුවට.*

2026 ජූලි මස 17 දින,
අංක 415, කොටා පාර,
රාජගිරිය.
විගණන සේවා කොමිෂන් සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***විගණන සේවා කොමිෂන් සභාව***

*ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ශ්‍රේණියේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම - 2026*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යය සහ අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල-2 / දෙමළ- 3/ ඉංග්‍රීසි-4

*සටහන :* අයදුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

---

01. (i) සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ..........................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම: ……………………………………………….........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(iii) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම: ………………………..…………………........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
*උදා :* GUNAWARDHANA, M.G.B.S.K.

02. (i) ස්ථිර ලිපිනය : ………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) දුරකථන අංකය: ස්ථාවර

ජංගම

03. (i) ස්ත්‍රී / පුරුෂ භාවය: ……………………………

(ii) විවාහක / අවිවාහක බව: ……………………………

04. (i) උපන් දිනය :
වර්ෂය: …………. මාසය : ………… දිනය : ………….

(ii) **2026** අගෝස්තු **17** දිනට වයස:
අවුරුදු : ………… මාස : ……… දින : ………

(iii) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන වග?
………………………………

(iv) ජාතිය: …………………………………...

(v) ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

05. (i) මෙම තනතුර සඳහා අයදුම්කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති අධ්‍යාපන සුදුසුකම්:

| *විභාගය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|
| | | |
| | | |

(ii) මෙම තනතුර සඳහා අයදුම්කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම්:

| *සුදුසුකම* | *වර්ෂය* | *ආයතනය* |
|---|---|---|
| | | |
| | | |

(iii) මෙම තනතුරට අයදුම්කිරීම සඳහා ලබාගෙන ඇති ක්ෂේත්‍ර පළපුරුද්ද:

| *තනතුර* | *ආයතනය* | *කාල සීමාව* |
|---|---|---|
| | | |
| | | |

(iv) භාෂා ප්‍රවීණතාවය :

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

06. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(i) තනතුර : ………………………………………………
(ii) දෙපාර්තමේන්තුව/ ආයතනය : ………………………………………………
(iii) පත් වූ දිනය : ………………………………………
(iv) ස්ථිරද, විශ්‍රාම වැටුප් සහිතද, තාවකාලිකද, නැතහොත් කොන්ත්‍රාත් පදනම මතද යන වග: ……………................
...................................................................
(v) වාර්ෂික වැටුප් පරිමාණය: ……………………………………………………
(vi) දැනට ලබන වාර්ෂික වැටුප: ……………………………………

07. ඔබ ගැන තොරතුරු විමසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය, තනතුර/රැකියාව සහ දුරකථන අංකය සඳහන් කරන්න.

(i) ………………………………………………………………
………………………………………………………………
(ii) ………………………………………………………………
………………………………………………………………

08. අයදුම්කරුගේ සහතිකය:

මෙම අයදුම්පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත්, මම දැන සිටිමි.

.................................,
දිනය : ……………… අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ……………………………………………………………… මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2026 ........... මස ............ වැනි දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

….…………………..,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ………………………
ස්ථානය : ……………………………….
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. අයදුම්කරු රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නිරත නම්, ඔහු පිළිබඳව ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ………………………………………………….. නමැති අයදුම්කරු / අයදුම්කාරිය ……………………වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවත්, අයදුම්කරු / අයදුම්කාරිය සේවයේ ස්ථිර කර ඇති /නැති බවත්, ඉහත 05 හි සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ................. දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

......................................................,
දිනය:............................. රාජ්‍ය /පළාත් රාජ්‍ය ආයතන ප්‍රධානියාගේ හෝ ඔහුගේ බලය ලත් නිලධාරියාගේ අත්සන.

07 - 211

## විගණන සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම - 2026

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුරට සෘජු ධාරාව මත බඳවා ගැනීම සඳහා අංක: 2366/31 හා 2024.01.12 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7.2.4 වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පහත සඳහන් සුදුසුකම්ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුරේ පවතින **පුරප්පාඩු 06** ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7.2.4.1.1 උපවගන්තියේ සඳහන් වෘත්තීය සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවා විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ලබා ගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව විගණන සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය විගණන සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

2. ***අවශ්‍ය සුදුසුකම් :-*** සෑම අයදුම්කරුවකුම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

**I.** ***වෘත්තීය සුදුසුකම් :-***

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය;

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥවරයකු වීම.

**II.** ***අධ්‍යාපන සුදුසුකම් :-*** අදාළ නොවේ.

**III.** ***පළපුරුද්ද :-*** අදාළ නොවේ.

**IV.** ***ශාරීරික යෝග්‍යතාව:-***
ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

**V.** ***වෙනත් සුදුසුකම්:-***
(i). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
(ii). විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
(iii). යම් ආගමික පැවිදිවරයක් දරන තැනැත්තකු නොවීම.
(iv). අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**VI.** ***වයස:-***
**2026 අගෝස්තු 17** දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර එදිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1991.08.17 දින සිට 2004.08.17 දින දක්වා එම දින ද ඇතුළත්ව උපන් දිනය යෙදෙන අයට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.
(රාජ්‍ය සේවයේ නියුක්ත නිලධරයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

***සටහන :-*** ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීමේ දී සේවා අවශ්‍යතාව සැලකිල්ලට ගෙන අවශ්‍ය අවස්ථාවල දී ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥවරුන් බඳවා ගැනීමේ බලය විගණන සේවා කොමිෂන් සභාව සතුවේ. එසේ සෘජුව බඳවා ගනු ලබන තැනැත්තන් ඉහත 2.V හි සඳහන් අනෙකුත් මූලික සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි :-**

(i). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii). මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii). 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, විගණන සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේ දී පනවනු ලබන / පැනවිය හැකි කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v). ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4. ***වැටුප් පරිමාණය :-*** 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.86,950 - 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 - රු.200,770/- (පියවර 01) වේ. මෙම තනතුරට හිමි වැටුප් කේතය AS 03 - 2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.86,950/- වේ. (2027.01.01 දින තෙක් ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ උපලේඛන III අනුවය.) මෙයට අමතරව තනතුරට අදාළ වන පරිදි රජය විසින් අනුමතකර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

5. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටිය** පදනම් කර ගනු ලැබේ :-

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | 25 |
| | (*අ*) **සාමාන්‍ය උපාධිය** | 10 | |
| | (*ආ*) **විශේෂ උපාධිය** | 11 | |
| | (*ඇ*) **2 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය** | 11 | |
| | (*ඈ*) **2 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය** | 13 | |
| | (*ඉ*) **1 වැනි පන්තිය සහිත සමාන්‍ය උපාධිය** | 13 | |
| | (*ඊ*) **1 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය** | 15 | |
| | (*උ*) **පශ්චාත් උපාධි ඩිප්ලෝමාව** | 18 | |
| | (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති,ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | | |
| | (*ඌ*) **MA/MSC හෝ ඒ හා සමාන වෙනත් උපාධියක්** | 20 | |
| | (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | | |
| | (එ) **ඉහත (ඌ) හි සඳහන් උපාධියකට වඩා ඉහළ උපාධියක්** (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 25 | |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02. | **අතිරේක වෘත්තිය සුදුසුකම්**<br>(මූලික වෘත්තීය සුදුසුකමට අමතරව ලබා ඇති ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | | 20 |
| | (අ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 07 | |
| | (ආ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික II/අන්තර්මාධ්‍ය පරීක්ෂණය /ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික පත්‍රය II/ ව්‍යාපාර අදියර/ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ II අදියර පරීක්ෂණය සමත් වීම | 09 | |
| | (ඇ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය/ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ III අදියර පරීක්ෂණය සමත් වීම | 12 | |
| | (ඈ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය | 15 | |
| | (ඉ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය | 20 | |
| 03. | **තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද** | | 40 |
| 04. | **තොරතුරු තාක්ෂණය / පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් :**<br>විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන මාස 6ක හෝ ඊට වැඩි කාලයක පරිගණක සහතිකපත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම හා සහතිකයක් ලබා තිබීම. | 05 | 05 |
| 05. | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය** | | 10 |
| | **මුළු එකතුව** | | **100** |

6. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-**

(i). අයදුම්පත් **"ලේකම්, විගණන සේවා කොමිෂන් සභාව, අංක 415, කොට්ටා පාර, රාජගිරිය."** යන ලිපිනය සඳහන් කර **2026 අගෝස්තු 17 දිනයට හෝ එදිනට පෙර** හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii). ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට

අංක 08 දක්වාත් තෙවැනි පිටුව අංක 09 සිට අංක 10 දක්වාත් වන ආකාරයට පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii). අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iv). අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්වකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන විධායක ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v). අයදුම්පතක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදුවිය හැකි ප්‍රතිවිපාක තමන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(vi). විදේශගත ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට තම අයදුම්පත් විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි රටට නැතහොත් ආසන්නම රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(vii). වෛද්‍ය පරීක්ෂණ සඳහා යානාපත්‍ර - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ශ්‍රී ලාංකික අයදුම්කරුවෙක් වේ නම්, ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිලිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු ය. එම පරීක්ෂණය සඳහා වන ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ යානාපත්‍ර වියදමත් එම අයදුම්කරු විසින්ම දැරිය යුතු ය.

(viii). රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් නියමිත දින හෝ එදිනට පෙර ලැබෙන සේ මා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෙම කාර්යාලයේ කිසිදු නිලධාරියෙකු නමට පෞද්ගලිකව නොඑවිය යුතු ය.

(ix). මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(x). අයදුම්පත්‍රය සමඟ පහත ලේඛනවල ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය.

(*a*) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත

(*b*) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත

(*සැ.යු :-* බෞතීස්ම සහතික හෝ උපකෘත පාසැල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කරන ලද උප්පැන්න සහතික පිළිගනු නොලැබේ.)

(*c*) සාමාන්‍ය උපාධිය සහ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් (අංක 5 යටතේ සඳහන්)

(*d*) ප්‍රධාන වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ 2. I පරිදි) සහ අතිරේක වෘත්තීය සුදුසුකම් (අංක 5 යටතේ සඳහන්) සනාථ කෙරෙන සහතිකවල පිටපත්

(*e*) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතික

(*f*) තොරතුරු තාක්ෂණය හා පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් (අංක 5 යටතේ සඳහන්)

(*g*) චරිතය පිළිබඳව සඳහන් වන මෑතකදි ලබාගත් සහතික දෙකක්

(දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

***සටහන -*** සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථකර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

8. **සාවද්‍ය තොරතුරු සැපයීම:-**

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හා නො පිරවීමේ අයිතිය විගණන සේවා කොමිෂන් සභාව සතු වේ.

10. මෙම *ගැසට්* පත්‍රයේ I කොටසේ II (අ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන්කර ඇති පරිදි රාජ්‍ය සේවා පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි මෙම තනතුරට බඳවා ගැනීම සඳහාද අදාළ වේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විගණන සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එච්.එම්. නන්දසේන,**
අතිරේක ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම් *වෙනුවට.*

2026 ජුලි මස 17 දින,
අංක 415, කොටා පාර,
රාජගිරිය,
විගණන සේවා කොමිෂන් සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***විගණන සේවා කොමිෂන් සභාව***

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම - 2026

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යය සහ අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල-2 / දෙමළ- 3/ ඉංග්‍රීසි-4 | | |

සටහන:අයදුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

---

01. (i) සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ......................................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම: ……………………………………………….........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(iii) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම: ………………………..………………….........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
උදා : GUNAWARDHANA, M.G.B.S.K.

02. (i) ස්ථිර ලිපිනය : ………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) දුරකථන අංකය: ස්ථාවර | | | | | | | | | | |

ජංගම | | | | | | | | | | |

03. (i) ස්ත්‍රී / පුරුෂ භාවය: ……………………………

(ii) විවාහක / අවිවාහක බව: ……………………………

04. (i) උපන් දිනය :
වර්ෂය: ............ මාසය : ............ දිනය : ............

(ii) **2026 අගෝස්තු 17** දිනට වයස:
අවුරුදු : ............ මාස : ......... දින : .........

(iii) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද යන වග?
....................................

(iv) ජාතිය: ........................................

(v) ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

05. (i) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති අධ්‍යාපන සුදුසුකම්:

| *විභාගය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|
| | | |
| | | |

(ii) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම්:

| *සුදුසුකම* | *වර්ෂය* | *ආයතනය* |
|---|---|---|
| | | |
| | | |

(iii) මෙම තනතුරට අයදුම් කිරීම සඳහා ලබාගෙන ඇති ක්ෂේත්‍ර පළපුරුද්ද:

| *තනතුර* | *ආයතනය* | *කාල සීමාව* |
|---|---|---|
| | | |
| | | |

(iv) භාෂා ප්‍රවීණතාවය :

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

06. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(i) තනතුර : ....................................................

(ii) දෙපාර්තමේන්තුව/ ආයතනය : .......................................................

(iii) පත් වූ දිනය : ...............................................

(iv) ස්ථිරද, විශ්‍රාම වැටුප් සහිතද, තාවකාලිකද, නැතහොත් කොන්ත්‍රාත් පදනම මතද යන වග: ................................
....................................................................

(v) වාර්ෂික වැටුප් පරිමාණය: ............................................................

(vi) දැනට ලබන වාර්ෂික වැටුප: ..........................................

07. ඔබ ගැන තොරතුරු විමසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනකුගේ නම, ලිපිනය, තනතුර/රැකියාව සහ දුරකථන අංකය සඳහන් කරන්න :

(i) ………………………………………………………………
………………………………………………………………
(ii) ………………………………………………………………
………………………………………………………………

08. අයදුම්කරුගේ සහතිකය:

මෙම අයදුම්පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත්, මම දැන සිටිමි.

.................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ………………

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන …………………………………………………………… මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2026 ........... මස ............ වැනි දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

…..………………….,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ………………………
ස්ථානය : ……………………………….
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. අයදුම්කරු රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නිරත නම්, ඔහු පිළිබඳව ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ………………………………………………….. නමැති අයදුම්කරු / අයදුම්කාරිය ……………………වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවත්, අයදුම්කරු / අයදුම්කාරිය සේවයේ ස්ථිර කර ඇති /නැති බවත්, ඉහත 05 හි සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ................ දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

.......................................................,
රාජ්‍ය /පළාත් රාජ්‍ය ආයතන ප්‍රධානියාගේ හෝ ඔහුගේ
බලය ලත් නිලධාරියාගේ අත්සන.

දිනය:.............................

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

### ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ සහ 155 අ (1) ව්‍යවස්ථා යටතේ, සහ 155අ (2) සහ 155අ (3) ව්‍යවස්ථාවන්ට යටත්ව, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇතිවී තිබෙන පුරප්පාඩු සහ ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීමට නිර්දේශ කරනු ලැබීම සඳහා, මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නව අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ "ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම" නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026 ජූලි මස 31 වැනි දින හෝ ඊට පෙර,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයේ විෂයය ලෙස "ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම" යනුවෙන් සඳහන් කරන්න.

මෙම පුරප්පාඩු සඳහා 2026 මාර්තු 27 දින පුවත්පත් සහ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද දැන්වීම් මත මීට පෙර අයදුම්පත් කැඳවන ලද අවස්ථාවේ අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් ද නැවතත් අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, නව අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 ජූලි මස 16 වැනි දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

07 - 318

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

### ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාව යටතේ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇතිවී තිබෙන පුරප්පාඩු පිරවීමට නිර්දේශ කිරීම වෙනුවෙන් මේ සඳහා උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නව අයදුම්පත් කැඳවනු ලැබේ.

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මානව හිමිකම්වලට අදාළ කාරණා සම්බන්ධයෙන් දැනුමක් හෝ ප්‍රායෝගික පළපුරුද්දක් ඇත්තා වූ තැනැත්තන් අතුරින් තෝරා ගනු ලබන සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම" නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළිලෙ කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026 ජූලි මස 31 වැනි දින හෝ ඊට පෙර,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutinalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් පණිවුඩයේ විෂයය ලෙස "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම" යනුවෙන් සඳහන් කරන්න.

මෙම පුරප්පාඩු සඳහා 2026 අප්‍රේල් මස 24 දින පුවත්පත් සහ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද දැන්වීම් හරහා මීට පෙර අයදුම්පත් කැඳවන ලද අවස්ථාවේ අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් ද මේ සඳහා අයදුම් කරන්නේ නම්, නව අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 ජූලි මස 16 වැනි දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

07 - 319

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා වන II කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

1.0 ඉහත සඳහන් සේවයට අයත් නිලධාරින් සඳහා අදාළ අංක 2444/21 හා 2025.07.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ තෙවන සංශෝධනය සහ අංක 2493/61 හා 2026.06.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සිව්වන සංශෝධනයේ විධිවිධානයන්ට අනුකූලව II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2026 ඔක්තෝබර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය උපලේඛනය I හි සඳහන් නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන ලද නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services" යටතේ ඇති " Online Applications – Recruitment/ E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජූලි මස 20 වැනි දින පෙ.ව. 09.00**ට විවෘත වන අතර **2026 අගෝස්තු මස 10 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.** අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපත් දෙකක් (02) ලබාගෙන එම පිටපත් දෙකෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය සමඟ ඉන් එක් පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතු ය. අනෙක් පිටපත අවශ්‍ය විටක ඉදිරිපත් කිරීම සඳහා තමන් භාරයේ තබා ගත යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

2.0

I. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

II. විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති ගැසට් පත්‍රයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනු ඇත.

III. මෙම විභාගය සඳහා අයදුම් කළ හැක්කේ ශ්‍රී ලංකා ගුරු සේවයේ සහ පළාත් රාජ්‍ය සේවාවල ගුරු සේවයේ පහත 12.0 මගින් දක්වන ලද නිලධාරින්ට පමණි.

IV. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

3.0 විභාග ගාස්තු:-

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පළමු වරට පවත්වනු ලබන බැවින් ගාස්තු අය කරනු නොලැබේ.

4.0 අයදුම්පත් යොමු කිරීම:-

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E -mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාග සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.0 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

6.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දක්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත,ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

7.0 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ අදාළ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.0 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

9.0 විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු ය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවශ්‍ය පරිදි රාජකාරි නිවාඩු ලබා දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි. ඒ අතුරින් තම පත්වීම් විෂයයට අදාළ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 ශ්‍රී ලංකා ගුරු සේවයේ සහ පළාත් රාජ්‍ය සේවය සඳහා ගුරු සේවා ව්‍යවස්ථාවේ 13.8 හි සඳහන් අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම මත 2 පන්තියේ II ශ්‍රේණියට සෘජුව බඳවා ගත් ගුරුවරුන් හැර, 2 පන්තියේ II ශ්‍රේණියට උසස් කරන ලද අනෙකුත් ගුරුවරුන් 2-II ශ්‍රේණියට උසස්වීම් ලබා වසර හතරක් (04) ගතවීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ යුතුය. එම නිලධාරීන්ට අමතරව, 2025.06.30 දක්වා II වන කාර්යක්ෂමතා කඩඉම් ඊළඟ උසස්වීමට පෙර සම්පූර්ණ කිරීමේ කොන්දේසිය මත 2-I ශ්‍රේණියට උසස් වීම් ලබා ඇති ගුරු සේවයේ නිලධරයන් ද එකී උසස්වීම් ලබා දීමේදී දක්වන ලද පරිදි ගුරු සේවයේ I ශ්‍රේණියට උසස්වීම සඳහා මෙම II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවශ්‍යතාව ද සම්පූර්ණ කළ යුතු වේ.

13.0 විභාග පරිපාටිය -

13.1 ප්‍රශ්න සැකැස්ම :

අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය විසින් e-thaksalawa නිල වෙබ් අඩවියේ පළ කරන ලද පහත 13.2 හි දක්වා ඇති ස්වයං අධ්‍යයන මොඩියුල සම්බන්ධ විෂය නිර්දේශය ආශ්‍රයෙන් සකස් වේ. මෙම කාර්යක්ෂමතා කඩඉම සඳහා වන ලිඛිත පරීක්ෂණය එම අදාළ මොඩියුල සියල්ලම ආවරණය වන සේ පහත පරිදි පැවැත්වේ.

| *ව්‍යුහය* | *ප්‍රශ්න සැකැස්ම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| I පත්‍රය | බහුවරණ | පැය 01 | 40 |
| II පත්‍රය | ව්‍යුහගත ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න | පැය 02 | 60 |

***සටහන 1*** - I පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම I පත්‍රය නිකුත් කරන අතර එය බහුවරණ ප්‍රශ්න 40 කින් වේ. II පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම II පත්‍රය නිකුත් කරන අතර එය ව්‍යුහගත ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 04 කින් සමන්විතය. එම ප්‍රශ්න පත්‍ර දෙකෙහිම අන්තර්ගත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

13.2 විභාගය සඳහා විෂය නිර්දේශය :

| *කාර්යක්ෂමතා කඩඉම* | *අදාළ වන මොඩියුල* |
|---|---|
| II වන කාර්යක්ෂමතා කඩඉම | 1. නායකත්ව සංවර්ධනය හා කළමනාකරණය |
| | 2. ක්‍රියාකාරකම් සැලසුම් සකස් කිරීමේ ඵලදායී ක්‍රම ශිල්ප |
| | 3. පන්ති කාමර කළමනාකරණය සහ අන්තර්කරණ අධ්‍යාපනය |

***සටහන 2*** - සාමර්ථ්‍යය සඳහා ඉහත 13.1 වගුව මඟින් දක්වන ලද I පත්‍රයේ සහ II පත්‍රයේ ලකුණුවල මුළු එකතුව 40% ක් හෝ ඊට වැඩිවන සේ ලබා ගත යුතුය.

14.0 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :- විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

I. විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන්ගේ (ජාතික හා පළාත්) ප්‍රතිඵල පළාත් අනුව වෙන් වෙන් වශයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පිටපත් දෙකක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබයි.

II. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබන එකී විභාග ප්‍රතිඵල ලේඛන පිටපත් දෙකෙන් එක් පිටපතක්; ජාතික හා පළාත් පාසල්වල සේවයේ නියුතු ගුරුවරුන්ගේ විභාග ප්‍රතිඵල සත්‍යාපනය කිරීමට හැකිවන පරිදි පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ.

III. එසේම, සියලුම ගුරු සේවයේ නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීමට හා ශ්‍රේණි උසස්වීම්වලට අදාළ වන කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල, විභාග දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුට ද බාගත කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. එසේ බාගත කර ගන්නා ප්‍රතිඵල ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම ප්‍රතිඵල ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සත්‍යාපනය කරගෙන අදාළ නිලධරයාගේ පුද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතුය.

IV. එකී සත්‍යාපනය කරන ලද ප්‍රතිඵල පදනම් කරගෙන පළාත්/කලාප අධ්‍යාපන බලධරයන් විසින් අදාළ ගුරුවරුන්ගේ පත්වීම ස්ථිර කිරීම හා ශ්‍රේණි උසස් කිරීම සඳහා අදාළ කටයුතු කළ යුතුවේ.

V. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

15.0 මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේනම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 ජූලි මස 10 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

උප ලේඛනය I

| **දිස්ත්‍රික්කය / නගරය** | **දිස්ත්‍රික් / නගර අංකය** |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් / නගර අංකය |
|---|---|
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

07 - 313

---

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**

(2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

**මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව**

අධ්‍යාපන මනෝවිද්‍යාව සහ ළමා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2026 (ප්‍රථම කණ්ඩායම - ප්‍රධාන බඳවා ගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ අධ්‍යාපන මනෝවිද්‍යාව සහ ළමා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හරහා අධ්‍යාපන මනෝවිද්‍යාව සහ ළමා උපදේශනය පිළිබඳ පුළුල් දැනුමක් ලබාගැනීමට හෝ මෙම විෂයය ක්ෂේත්‍රය හරහා උසස් ජාතික ඩිප්ලෝමා අදියරය දක්වා සිය වෘත්තීය දැනුම වර්ධනය කරගැනීම සඳහා උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකිය.

**සුදුසුකම් :**

1. ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යාතනයේ ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව හදාරා ඇති ශිෂ්‍යයින්; *හෝ*
2. රාජ්‍ය විශ්වවිද්‍යාලයක ළමා හෝ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර/ ඩිප්ලෝමා/ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ඇති ශිෂ්‍යයන්; *හෝ*
3. අධ්‍යාපනවේදී හෝ ජාතික ගුරු ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හදාරා දැනට ගුරු සේවයේ නියුතු ගුරුවරුන් සඳහා අයදුම් කළ හැකියි.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට මෙම පාඨමාලාව සඳහා කිසිදු වයස් සීමාවකින් තොරව ඉල්ලුම් කළ හැකියි.

***පාඨමාලාවේ ස්වභාවය :*** මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

***මාධ්‍ය :*** සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය :**

එක් අවුරුදු අර්ධ කාලීන පාඨමාලාවකි. සජීවී දේශන, පහසු දිනයන් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

***පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු :*** මුළු පාඨමාලා ගාස්තුව රු. 30,000.00 කි.
පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000.00ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතු ය.
රු. 30,000.00 ක මුදල එකවර හෝ රු. 2500.00 බැගින් දොළොස් මාසිකව ගෙවිය හැකිය.

**පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :**

අයදුම්කරු විසින් -

1. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ ඉදිරි සහ පිටුපස ඡායාරූපය,
2. ඉහත සඳහන් උසස් අධ්‍යාපන සහතිකපත්‍රවල ඡායාරූප.

070 - 419 1660 (WhatsApp) අංකයට යොමු කළ යුතු ය.

*වැඩි විස්තර සඳහා :* කාර්යාලීය වේලාවන් වන පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා 032 - 3137500 දුරකතන අංකය ඔස්සේ මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව අමතා විමසිය හැකිය.

ප්‍රධානී - මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

07 - 281/1

---

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**

**(2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)**

ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව 2026
(තෙවන කණ්ඩායම - ප්‍රධාන බඳවා ගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හරහා ළමා මනෝවිද්‍යාව සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳව මූලික දැනුමක් ලබාගැනීමට හෝ ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව සිය උසස් අධ්‍යාපනය සඳහා හැදෑරීමට උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකි ය.

**සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් ලබාගත් S3 සාමාර්ථය සහිතව සමත් වීම සහ 2026.07.01 දිනට වයස 18ට වැඩි වීම, යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

*පාඨමාලාවේ ස්වභාවය :* මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

*මාධ්‍ය :* සිංහල හෝ ඉංග්‍රීසි

*පාඨමාලා කාලය :*

සය මාසික අර්ධ කාලීන පාඨමාලාවකි. පහසු දිනයන් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

*පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු :* මුළු පාඨමාලා ගාස්තුව රු. 15,000.00 කි.
පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000.00ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතු ය.
රු. 15,000.00 ක මුදල එකවර හෝ රු. 2500.00 බැගින් සය මාසිකව ගෙවිය හැකිය.

**පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :**

අයදුම්කරු විසින් -

1. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ ඉදිරි සහ පිටුපස ඡායාරූපය,
2. අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ ඡායාරූපය,
3. තම වර්ණවත් පැහැදිළි ඡායාරූපය (මාර්ගගත ශිෂ්‍ය හැඳුනුම්පත සැකසීම සඳහා.

070 - 419 1660 (WhatsApp) අංකයට යොමු කළ යුතු ය.

*වැඩි විස්තර සඳහා :* කාර්යාලීය වේලාවන් වන පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා 032 - 3137500 දුරකතන අංකය හරහා විමසිය හැකි ය.

ලේඛකාධිකාරී - මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

07 - 281/2

---

**සංශෝධනය යි**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

***සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරට විවෘත පදනමින් බඳවා ගැනීම***

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරට විවෘත පදනමින් බඳවා ගැනීම සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,481 දරන හා 2026.03.20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද *ගැසට් නිවේදනයේ* පහත 03 සහ

15 වගන්ති සංශෝධනයන් සිදු කිරීමට සහ එම නිවේදනයට 01(i) වගන්තිය ඇතුලත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇති බව එහි නියමය පරිදි කාරුණිකව දන්වමි.

**01. (I)** *සටහන:* අංක 2,392 දරන හා 2024.07.05 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා දැනටමත් අයදුම් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

**03. වගන්තිය :** පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 02 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**15. වගන්තිය :** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

**02.** ඉහත සංශෝධනයන් තුළින් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2026.04.20 දිනය වෙනස් නොවන බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**කේ. ඒ. විමලේන්තිරරාජා,**
ලේකම්,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය.

අංක 492,
ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

07-276

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය (III ශ්‍රේණිය) රියදුරු (දෙපාර්තමේන්තුගත) හා ගිලන්රථ රියදුරු තනතුර සඳහා වන විවෘත තරග විභාගය - 2026**

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින රියදුරු (දෙපාර්තමේන්තුගත) හා ගිලන්රථ රියදුරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රියදුරු (දෙපාර්තමේන්තුගත) හා ගිලන්රථ රියදුරු තනතුරු සඳහා වේ.

II. ලිඛිත විභාගය :- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 01කින් සමන්විත වේ.

- බුද්ධි පරීක්ෂණය හා කාර්මික දැනුම

**02. විභාග දිනය සහ විභාගය පැවැත්වීම :**

මෙම විභාගය 2026 ඔක්තෝබර් මස කොළඹ නගරයේ ස්ථාපනය කරනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වේ.

**03.** පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව රියදුරු (දෙපාර්තමේන්තුගත) තනතුරු 18 ක් හා ගිලන් රථ රියදුරු තනතුරු 03 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

**04. සේවා කොන්දේසි :**

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත් ව අපේක්ෂකයකු අදාළ තනතුරේ රියදුරු (දෙපාර්තමේන්තුගත) හා ගිලන්රථ රියදුරු තනතුරට පත්කරනු ලැබේ.

4.2 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. රියදුරු (දෙපාර්තමේන්තුගත) තනතුරේ හා ගිලන්රථ රියදුරු තනතුරේ III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද, II ශ්‍රේණියට පත්ව වසර 03ක් ගතවීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද, I වන ශ්‍රේණියට පත්ව වසර 05ක් ගතවීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද සමත්විය යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.

**05. මාසික වැටුප් පරිමාණය :** මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි PL - 3/2025 (පියවර I) වැටුප් ඛණ්ඩය අදාළ වේ. එම වැටුප් ඛණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.
රු. 42,780 - 10x 490 - 10x540 - 10x 590 - 12x630 - රු. 66,540
(2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු. 42,780/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ.)

**06. බඳවා ගැනීමේ සුදුසුකම් :**

(අ) (I) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(II) මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත විය යුතුයි. චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත් කිරීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේ ය.

(III) ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

(IV) අවම උස අඩි 5 අඟල් 4ක් (පිරිමි) විය යුතු ය.

(V) අයදුම්කරුවන් සඳහා පපුවේ හුස්ම නාල්ලා අඟල් 32 ක් විය යුතු ය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් හයක් (06) ක් සමත්ව තිබිය යුතු ය.

(ඇ) වෘත්තීය සුදුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බර වාහන වලංගු බලපත්‍රයක් ලබා තිබීම.

(ඈ) පළපුරුද්ද : මෝටර් රථ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබීම.

(ඉ) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

I. ආගමික පැවිදිවරයෙක් දරන කිසිදු තැනැත්තෙකුට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

II. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

III. රියදුරු (දෙපාර්තමේන්තුගත) හා ගිලන් රථ රියදුරු තනතුරට බඳවා ගන්නා තෙක් ඉහත 06 (අ) හි සඳහන් සුදුසුකම් බලපැවැත් වේ.

(ඊ) වයස : අයදුම්පත් භාරගන්නා අවසාන දින එනම් 2026.08.07 දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය.

**07. විභාග ගාස්තු :**
විභාග ගාස්තුව රු. 600/- කි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනාරාල්ගේ නිල ගිණුම වන ලංකා බැංකුවේ බොරැල්ල අධිශ්‍රේණි ශාඛාවේ අංක 704191 දරන ගිණුමට දිවයිනේ පිහිටි ඕනෑම

ලංකා බැංකු ශාඛාවක් වෙත මුදල් ගෙවා අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය. කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් නොකෙරේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

**08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

8.1 ඉල්ලුම්පත්‍රය මේ සමග ඉදිරිපත් කර ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8.27" x 11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් සිය අත් අකුරෙන් ම සම්පූර්ණ කල යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද හෝ යතුරුලියනය කරන ලද හෝ අයදුම්පත් ද භාවිතා කළ හැකි ය. ශීර්ෂ අංක 01 සිට 09 තෙක් පළමුවන පිටුවට ද, 10 සිට 14 තෙක් දෙවන පිටුවට ද, 15 සිට 17 දක්වා තුන්වන පිටුවට ද, වන ලෙස ගෙන සකස් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) තව ද, සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

8.2 ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන මාධ්‍යයෙන් ම විය යුතු ය.

8.3 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර 2026.08.07 දින හෝ ඊට පෙර "බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, ආයතන ශාඛාව, බන්ධනාගාර මූලස්ථානය, අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "බන්ධනාගාර රියදුරු (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය - 2026 හෝ" බන්ධනාගාර ගිලන්රථ රියදුරු බඳවා ගැනීමේ විවෘත තරග විභාගය යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට, එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

8.4 ඉල්ලුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය. දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරින් ස්වකීය ඉල්ලුම් පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙවැනි නිලධාරියකු තෝරාගතහොත් දැනට ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා තහවුරු කර තිබිය යුතු ය.

8.5 අවශ්‍ය සුදුසුකම් නොමැති අයදුම්කරුවන්, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර සහ ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.6 ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත් වල හා බන්ධනාගාර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දන්වා සිටිය යුතු ය. එහිදී ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතු ය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඔබගේ ඉහත විස්තර ඇතුළත් ලිපියක් ෆැක්ස් මගින්, විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද, සඳහන්කොට එම දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ද, සුදුසු වේ. එහි දී අවශ්‍ය තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම් කොට ළඟ තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

**09. විභාගයට ඇතුළු වීම :**

(අ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපත් වෙත භාරදිය යුතු ය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදු වනු ඇත.

(ආ) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

**10. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(I) ජාතික හැඳුනුම්පත;
(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(III) වලංගු රියදුරු බලපත්‍රය.

**11. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :**

අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

**12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :**

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩදෙනු නොලැබේ.

**13. බඳවා ගැනීමේ ක්‍රමය :**

I. ලිඛිත විභාගය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා කාර්මික දැනුම | 100% | 40% |

විෂයය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්වය කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
| කාර්මික දැනුම | වාහන නඩත්තුව සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |

II. වෘත්තීය පරීක්ෂණය

| *විෂයයන්* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| i. | මාර්ග නීති | 100% | 40% |
| ii. | මාර්ග සංඥා | | |
| iii. | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් පත්කරනු ලබන පරීක්ෂකවරයකු, පොලිස් රථ වාහන අංශයේ නිලධාරියකු සහ දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියකු විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය | | |

III. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

14. ඉහත I හා II පරීක්ෂණ දෙකෙහි ලකුණුවල එකතුව මත දක්වන කුසලතා අනුපිළිවෙල අනුව එක් එක් තනතුර සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කරනු ලැබේ.

15. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය.

16. එම අපේක්ෂකයන් ලිඛිත විභාගයේ දී සහ වෘත්තීය පරීක්ෂණයේ දී ලබාගත් මුළු ලකුණු එකතුව මත පිළිවෙලින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් රියදුරු (දෙපාර්තමේන්තුගත) තනතුර හා ගිලන් රථ රියදුරු තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

***සැළකිය යුතු යි. :-*** සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

❖ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර,**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා. ආ.).

2026 ජූනි මස 24 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය (III ශ්‍රේණිය)**
**රියදුරු (දෙපාර්තමේන්තුගත) තනතුර සහ ගිලන්රථ රියදුරු තනතුර සඳහා වන විවෘත තරග විභාගය - 2026**

- ඔබ විසින් අයදුම් කරන තනතුර ඉදිරියෙන් ✓ සලකුණ කොටුව තුළ යොදන්න.

- රියදුරු (දෙපාර්තමේන්තුගත) ☐ විභාගයට පෙනී සිටින මාධ්‍යය :

  සිංහල ☐

  දෙමළ ☐

  ගිලන්රථ රියදුරු ☐ ඉංග්‍රීසි ☐

**(සැළකිය යුතුයි :- එක් තනතුරක් සඳහා එක් අයදුම්පතක් පමණක් යොමු කරන්න. තනතුරු දෙකම සඳහා අයදුම් කරන්නේ නම් අයදුම්පත් දෙකක් වෙන වෙනම යොමුකළ යුතු ය.)**

01. (i) සම්පූර්ණ නම : ..............................................................

(ii) මුලකුරු සමග නම: ..............................................................

02. ස්ථිර ලිපිනය : ..............................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය: ................................

04. (i) දුරකථන අංකය : ..............................................................
(ii) විද්‍යුත් තැපැල් ලිපිනය : ..............................................................

05. පදිංචි ලිපිනය අයත් වන -

(i) දිස්ත්‍රික්කය : ................................

(ii) පොලිස් ස්ථානය : ................................

06. උපන් දිනය :- අවුරුද්ද: ☐ මාසය : ☐ දිනය : ☐

07. 2026.08.07 දිනට වයස :- අවුරුදු : ☐ මාස : ☐ දින : ☐

08. පුරවැසිභාවය (පරම්පරාවෙන්/ ලියාපදිංචි වීමෙන්) :- ..........................................................................................................

09. විවාහක/ අවිවාහක බව :- ☐ විවාහක - 1 අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

10. අධ්‍යාපන සුදුසුකම් (පැහැදිලිව දැක්විය යුතු ය.)
(සහතිකවල ඡායා පිටපතක් අමුණන්න)
අ.පො.ස. (සා. පෙළ විභාග ප්‍රතිඵල)

I. පළමුවර
වර්ෂය - ............................................
විභාග අංකය - ............................................

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

II. දෙවනවර
වර්ෂය - ............................................
විභාග අංකය - ............................................

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. වලංගු රියදුරු බලපත්‍රයේ අංකය හා ශ්‍රේණිය : ..........................................................................................
(වලංගු රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් අමුණන්න)

(i) පළපුරුද්ද (අවුරුදු) :- ..........................................................................................

(ii) විශේෂ සුදුසුකම් :- ..........................................................................................

12. වෘත්තීය සුදුසුකම් :- ..........................................................................................

13. කායික සුදුසුකම් :-

(i) උස : අඩි : ........... අඟල් : ...........

(ii) පපුව (හුස්ම නාල්ලා) : අඟල් : ...........

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියෙන් වරදකරු කරනු ලැබ තිබේ ද? ඔව්/ නැත
(ඔව් නම් විස්තර සඳහන් කරන්න.)
.......................................................................................................................................................
.......................................................................................................................................................

15. විභාග ගාස්තු ගෙවීම :-

| *ගෙවන ලද මුදල* | *ගෙවූ බැංකු ශාඛාව* | *ගෙවූ දිනය* | *ලදුපත් අංකය* |
|---|---|---|---|
| | | | |

ලදුපත මෙතනින් අලවන්න.

16. *අයදුම්කරුගේ සහතිකය:*

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි යැයි විභාගය පැවැත්වීමට පෙර හෙළිවුවහොත්, විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීම් දිනෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මාගේ පත්වීම අවලංගු වන බවත් හොඳාකාරව දනිමි.

.................................,
දිනය : ………………  අයදුම්කරුගේ අත්සන.

17. රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි.

………………………………………………….. යන අය මෙම ආයතනයේ ……………………කු වශයෙන් සේවයේ නියුක්ත බව ද, ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, ඔහුට විනය පරීක්ෂණ/ විනය විරෝධී ක්‍රියා ඇති/ නැති බව ද, තනතුර සඳහා තෝරාගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/ නොහැකි බව ප්‍රකාශ කරමි.

.......................................................,
දිනය:............................. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.

07 - 225

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.